# වසන්ත රෝහණ
# නම් වූ සොඳුරු සන්නිවේදකයා



හඬ ,භාෂාව සහ දැණුම යන කරුණු කාරණා තුනෙන්ම පොහොසත් නිවේදකයින් අපට සිටියේ අතලොස්සකි. වර්තමාණයේ එම පිරිස අතේ ඇඟිලි ගනනටත් වඩා අඩුය .ගුවන් විදුලිය විසින් බිහිකල බොහෝ නිවේදකයින් මේ හඬ ,භාෂාව සහ දැණුම යන කරුණු තුනෙන්ම ඉතා පොහොසත් විය .එම පරපුරේ දැවැන්තයින් අතර වසන්ත රෝහණ නැමති සලකුණද අපට හමු වනුයේ ගුවන් විදුලිය ,නැමති සන්නිවේදනයේ මහගෙදර විසින් බිහිකළ තවත් එක් විශිෂ්ටයෙකු ලෙසය .

නිහතමාණි බව ආභරණයක් කරගත් මේ සොඳුරු සන්නිවේදකයා මට පළමුව මුණ ගැසෙන්නේ එච් .එම් .ජයවර්ධනයන්ගේ සමීපතයෙකු ලෙසය. වසර 25කට ආසන්න කාලයක් නිවේදකයෙකු වැඩසටහන් නිෂ්පාදකයෙකු සහ ගේය පද රචකයෙකු ලෙස දිගු ගමනක් යන වසන්තයන් මේ පසු කරනුයේ ඔහුගේ දිවියේ පනස්වන දිවි කඩ ඉමයි. වර්ෂ 1965 සැත්තැම්බර් මස 16 වන දින ගම්පහ ඉහලයා ගොඩ නැමති ග්‍රාමයේදී මෙලොව එලිය දුටු වසන්ත රෝහණ තම ජීවිකාව ලෙස පළමුව තෝරා ගනුයේ ගුරු වෘත්තියයි . පසුව නිවේදකයෙකු ලෙස ගුවන් විදුලිය හා එක් වන වසන්ත අද වන විට වැඩසටහන් නිෂ්පාදකයෙකු සහ ගේය පද රචකයෙකු ලෙස ක්ශේත්‍රයේ තම ලකුණ තබා හමාරය .

චානක ඉලංගගේ 365 දින මුළුල්ලේ

තම පසු පරම්පරාවටද ගුරු හරු කම් ලබා දෙමින් ශේත්‍රයේ අද නම කියැවෙන බොහෝ නිවේදක නිවෙදිකාවන්ගේ ගුරුවරයාවූ මේ සොඳුරු මිනිසා බොහෝ විට තිරයෙන් පිටුපස චරිතයක්ම විය. ඔහු නව පරපුරට මඟ සලසන්නෙකුම විය

ඔහු ගැන ලෝකයා දන්නා කරුණු අල්පය. ඔහු කලාවට දුන්දේ බොහෝය කලාව තම ආත්මය කරගත් මේ සොදුරු සන්නිවේදකයා තමන් ආ මග සහ මාධ්‍ය කලාවේ අද තත්වය ගැන සන්නස සමග සාකච්ඡා කළේ මෙන්න මේ ආකාරයටය .

ගම්පහ බණ්ඩාරනායක විදුහලෙන් උසස්පෙළ සමත්ව ගුරුවරයෙකු ලෙස සේවය කරන ගමන්ම තමයි මම තරුණ සේවා සභාව ,මහපොළ වැඩසටහන වැනි වැඩසටහන් හරහා මගේ කථිකත්වය සහ නිවේදන හැකියාව මුවහත් කරගත්තේ. මීට අමතරව මම මුල් කාලයේ සංගීත කණ්ඩායම් කීපයකම නිත්‍ය නිවේදකයා ලෙසත් කටයුතු කළා. ඔන්න ඔය අතරතුර තමයි මට මහපොළ වැඩසටහන මගින් සම්මානයක් ලැබෙන්නේ පළමු වරට මගේ කථිකත්වය සඳහා . ඔය සම්මානය හරහා තමයි මට ගුවන්විදුලි සංස්ථාවට සම්බන්ද වෙන්න ලැබෙන්නෙත් .ගුරු වෘත්තිය කියන්නේ මා බොහෝසේ ඇලූම් කල ක්ශේත්‍රයක් .නමුත් පසුව මට වැටහුනා මේ ගුරුකමයි ,නිවේදන කටයුත්තයි දෙකම එකවිට කරන්ඩ යෑම හරියන්නෑ කියන කරුණ .ඔය දෙකෙන් එකක් තෝරා ගන්න ඕන කියන කාරණය .ඔන්න ඔතන ඉදල තමයි මම මගේ ගුරු කමට සමුදීල පූර්ණ කාලීණ නිවේදකයෙකු ලෙස ගුවන් විදුලියේ පත්වීම ලබන්නේ .ලඕනෑම ශේත්‍රයක සාර්ථක ගමනක් යන්න නම් කැපවීම සේම අශාවද තිබිය යුතුයි

1980 අග භාගයේ නැතිනම් 90 මුල තමයි සිටි එෆ් .එම් සේවයට අපිව පළමු වරට බදවා ගන්නේ .මෙහිදී නවක නිවේදකයින් ලෙස අපි පුහුණුව ලබනවා .මෙම පුහුණුව සමග ක්‍රමක් ක්‍රමයෙන් තමයි අපි ඉදිරියට එන්නේ. ඔය කාලය තුල මම අලූත් වැඩසටහන් කීපයක්ම නිෂ්පාදනය කළා .ලංකාවේ බොහෝ ප්‍රදේශ වලට ගියා, ගිහින් වැඩසටහන් ඉදිරිපත් කළා. තව ගීත කීපයක්ද රචනා කරනවා ඔය කාලය තුල. පසුව ප්‍රසංග වේදිකාවේත් මම මගේම කියල අනන්‍යතාවක් ගොඩ නගා ගන්නවා. කේ.ඩී .කේ .ධර්මවර්ධන ,ප්‍රේම කීර්ති.ද. අල්විස් ,බණ්ඩාර .කේ .විජේතුංග ගෙන් පසුව ප්‍රසංග කලාවේ මටම වෙන්වූ ශෛලියක් ,රටාවක් මම හදා ගන්නවා . ඒ තුලින් මට බොහෝ ගෘහස්ත ප්‍රසංග වලටද ආරාධනා ලැබෙනවා .එවැනි ආරාධනාවක ප්‍රතිපලයක් ලෙස තමයි වික්ටර් රත්නායකයන්ගේ ස ප්‍රසංගයේ නිවේදන කටයුතු මට බාර වන්නේ , පසුව අමර සිරි පීරිස්ගේ හන්තානට සඳ ටි .එම් ජයරත්නගේ සොඳුරු අතීතයේ, එඩ්වර්ඩ් ජයකොඩිගේ මාරම්බරී බණ්ඩාර අතාවුද ගේ රුවන් තාරකා වගේ ප්‍රසංග වල නිත්‍ය නිවේදකයා ලෙස වැඩකටයුතු කිරීමේ භාග්‍යය ලැබෙන්නේ .අද වෙද්දී නම් මම රාත්‍රී සංදර්ශන සදහා යන එක නතර කරලා නමුත්, ගෘහස්ත ප්‍රසාංගික වැඩසටහන් එක්ක මම තව දුරටත් මේ සෞන්දර්ය චාරිකාවේ යෙදෙනවා .මේක හරිම හිමින් ආපු ගමනක් .අද තරුණ පිරිස යන තාලයේ ගමනක් නෙවෙයි .හැකියාව සහ කැපවීම මත තමයි එදා හැමදේම තීරණය වුනේ .

අද මම නිවේදන කටයුතුවලට අමතරව රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය පුහුණු ආයතන කීපයකම මාධ්‍ය කටයුතු පිළිබඳව ඉගැන්වීමෙහි යෙදෙනවා. මම මේ කටයුත්ත කරන්නේ ඉතාම කැමැත්තෙන් සහ කැපවීමකින් . අපිට පෙර සිටි අපේ ජ්‍යෙෂ්ඨයින් අපිට යන්න මග සලසා තිබුනා සේම අපේ පසු පරම්පරාවටත් මේ ගමන යන්න අපි මග සකස්කල යුතුයි .එය යුතුකමකට එහාගිය කාලයේ වග කීමක් ලෙසයි මම දකින්නේ .මාධ්‍ය සාරධර්ම ,මාධ්‍ය කලාවේ නිර්ණායක ,සමාජීය දැණුම හඬ පෞර්ෂය ,භාෂාව වගේ කරුණු ගැන නව පරපුර වැඩි තැකීමක් නොකරන යුගයක අපේ වගකීම විය යුත්තේ මේ කරුණු කාරනා පිළිබඳව නිසි දැණුමක් නිසි වැඩපිළිවලකට අනුව මේ අලූත් පරම්පරාව තුල රෝපණය කර ලීමයි .මාධ්‍ය කලාව වාණිජ කරණය වූ අද වගේ යුගයක මෙය ඉතා අපහසු කට යුත්තක් .නමුත් එය විවේචණය කර කර ඉන්නවට වඩා අඩු තරමින් උත්සහයක හෝ නොයෙදුනොත් අනාගතයේ දවසක අපේ පසු පරම්පරාව අසයි නුඹලා අපි වෙනුවෙන් මොනවද කලේ කියල .

1990 ගුවන් විදුලියේ පත්වීම ලැබිලා,එය ස්ථිර වෙලා මම යනව කඳුරට සේවයට, කඳු රට එෆ් .එම් ඒ කාලය තුල ඉතාම ජනප්‍රිය වෙනවා .පසුව යනවා පළාලි වලට පළාලි වලින් ආපසු එනවා කොළඹට , ඔන්න ඔය කාල සීමාව තුල මට ආරාධනාවක් ලැබෙනවා ට්‍රයිකෝ ආයතනයෙන් එමිරේට් රාජයේ තිබෙන ඔවුන්ගේ ගුවන් විදුලි සේවය සමග එක් වෙන්න කියල. ඒය සිදු වන්නේ කේ .ඩී .කේ ධර්මවර්ධනයන්ගේ අභාවයත් සමගයි . මේ ආරාධනාව කලේ එවකට ට්‍රයිකෝ අධ්‍යක්ෂකව සිටි ගාමිණී කන්නංගර සහ ජයන්ත කන්නංගර යන මහත්මයින් .පසුව මම ගුවන් විදුලියෙන් ඉවත්ව එමිරේට් රාජ්‍යට ගොස් වසර තුනක් පමණ එහි සේවය කරනවා .මට ඇත්තටම ඒ ගුවන් විදුලිය හොද තත්වයකට ගෙනෙන්න හැකි වෙනවා .මටත් මේක අලූත් අත්දැකීමක් වෙනවා . මිනිස්සුත් එක්ක ගැවසෙන්න ,ඒ රටේ තොරතුරු හොයන්න ,ලංකාවේ තොරතුරු එහෙට දෙන්න ,ලාංකිකයින්ගේ ගුවන් විදුලියක් විදිහට මේ දේවල් කරගෙන යන්න ලැබෙනවා .පසුව වසර තුනකට පසුව ලංකාවට එනවා .ඇවිත් යලිත් ගුවන් විදුලි සංස්ථාව සමග එකතු වෙනවා .එක එක්තරා ආකාරයක අභියෝගයක් වෙනවා මට ,මොකද ආපහු එනකොට හැමදේම වෙනස් වෙලා .ආපහු මුල ඉදලම පටන් ගන්න සිදුවෙනවා .එතන ඉදල තමයි අපහු මේ සෞන්දර්ය චාරිකාව පටන් ගන්නේ .

මගේ මාධ්‍ය ජීවිතයේ වසර 25 මම ගුවන් විදුලියේ ,රූපවාහිණියේත් වසර 10 පමණ කාලයක් ඉන්නවා. රටවල් ගණනාවකට මම ප්‍රසංග සමග යන්න ලැබෙනවා මේ ලබපු අත්දැකීම් සමග තමයි මෙතරම් කාලයක් මේ ක්ශේත්‍රයේ රැදෙන්න ලැබුනේ .

මට ලැබෙනවා ශිෂ්‍යත්වයක් කොරියාවේ සියෝල් කියන විශ්ව විද්‍යාලයට සන්නිවේදනය සහ තරුණ කටයුතු කියන විෂය සදහා .ඊට අමතරව ඩුබායි රාජ්‍යයේ මිඩියා සිටි කියන ආයතනේ මම මාධ්‍ය පිලිබඳව හැදෑරීමක් කළා . පසුව යනවා ජපානයට මාධ්‍ය පිළිබඳව තව දුරටත් හදාරන්න .මේ තුළන් තමයි මම ඉගන ගත්තේ කොහොමද නව තාක්ෂනය සමග මුහුවෙන්නේ ,කොහොමද මේ තරගකාරිත්වයට මුහුණ දෙන්නේ කියන කරුණු කාරණා. ඊට අමතර මම කොළඹ විශ්වවිද්‍යාලයෙන් ජනමාධ්‍ය පිළිබඳව ඩිප්ලෝමාවද ලබා ගන්නවා

අපි යමක් කරන්න ප්‍රථම ඒ ගැන නිසි හැදෑරීමක් කලයුතුයි ,අපි ඒ ගැන කරුණු කාරණා සෙවිය යුතුයි . මේ නිවේදන වෘර්තියටත් මේක පොදුවූ කරුණක් .නිකන් කට තිබුන පලියට කෙනෙකුට නිවේදකයෙකු වෙන්න බෑ . මේ මොනවා හරි කොළයක් බලාගෙන හෝ හිතට එන කරුණු ගිරවු වගේ කියවගෙන ගිය පලියටත් නැත්තනම් කට මුකරි කමටවත් නිවේදකයෙක් වෙන්න බෑ .එකට හොද හැදෑරීමක් ,දැණුමක් සහ පරිචයක් තිබිය යුතුයි . එහෙම මුකුත්ම නැතිව අවා කියමුකෝ , එතැන් ඉදල ඔහු හෝ ඇය හදාරන්න ඕන නැති නම් ඉගනගන්න ඕන ,අලූත් දේවල් සොයන්න ඕන , එහෙම නැති නම් ක්ශේත්‍රයේ පැවැත්මක් ,රැදීමක් නැති වෙනවා . ඔහු හෝ ඇය දක්ෂ වෙන්න ඕන ඉදිරියට යන්න .එහෙම නැතිව නිවේදකයෝ සන්නිවේදකයෝ මවන්න බෑ . අද මේ කට්ටියක් ඉන්නවා පිටපත් රචකයෝ කියල .මේ ගොල්ලෝ කොළයක මොනවා හරි ලියාගෙන මැෂින් වගේ කියවනවා .කථිකයෙක් ප්‍රකාශකයෙක් උනහම එතන කථා කරන්න පුළුවන් කම තියෙන්න ඕන එයාට පිටපත් අවශ්‍ය නෑ .කරුණාරත්න අබේසේකරයන්ලා පිටපත් ගත්තේ නෑ ආරියදාස පීරිස් ,ලලිත් .එස් . මෛත්‍රී වැන්නවුන් එතන හිටලා කථා කලේ . ඒ චතුර බව ඒ ගැලපීම තියෙන්න ඕන .

අනිත් කරුණ සහ නොගැලපීමනම් අද හඬට වඩා බලන්නේ රූපය .මට මේ ගැන කියන්නේ තියෙන්නේ එකම දෙයයි ඒගොල්ලන්ගේ හැඩ තියෙනවා වැඩ නෑ, අපේ වැඩ තියෙනවා හැඩ නෑ කියන එකයි .

අපි කවදාවත් අපේ පෙර ගමන්කරුවන්න්ට ,ප්‍රවීනයන්ට අභියෝග කරන්න යන්න හොදනෑ .ජ්‍යේෂ්ඨත්වයට අභියෝග කරන්න යන්න හොද නෑ .ජ්‍යේෂ්ඨයට අපි ගරු කරන්න ඕන .එහෙම කරොත් විතරයි අපේ ගමන ස්ථිර වෙන්නේ .නමුත් අලූත් පරම්පරාව තුල මම මේ ගති ගුණ දකිනවා අඩුයි .

විශිෂ්ඨ ශ්‍රේණියේ නිවේදකයකු ලෙස මාගේ කාර්යය ගුවන් විදුලිය තුල හරවත් රසවත් සහ කාලෝචිත වැඩසටහන් ශ්‍රාවකයා වෙත සමීප කිරීමයි .ඒ අතරිනුත් මම වැඩි රුචිකත්වයක් දක්වන්නේ සංගීතමය වැඩසටහන් සදහයි .සංස්ථාව මට ලබාදී තිබෙන්නේත් බොහෝවිට සංගීතමය, ගීතමය වැඩසටහනුයි .කීපයක් හැදින් උවහොත් ,ආරාධනා,මියුරු කල්පණා ,ගීතාන්ජලී වගේ වැඩසටහන් පුළුවන් .

දේශපාලණය සහ රැකියාව කියන්නේ මට දෙකක් මිසක එකක් නොවෙයි .මම කිසිම දවසක පක්ෂ දේශපාලනය ගුවන් විදුලිය ඇතුලට ගෙනනැල්ල නෑ .නිවේදකයෙකු විදිහට ආයතන මට්ටමෙන් මගේ ඉහල කළමණාකාරීත්වය මට පවරන රාජකාරිය ඉටුකිරීමට මම මගේ රැකියාවට බැදීසිටිනවා .මගේ දේශපාලණය තියෙන්නේ ආයතනයෙන් පිටත .මම මගේ පෞද්ගලික දේශපාලණය ගැන හිතල නෙවෙයි ගුවන් විදුලියේ සේවය කරන්නේ ,මගේ සේවය ගුවන් විදුලියෙන් සිදුවිය යුතු සේවය ගැන හිතලයි .ඒ නිසා එදා මෙදා තුර පැවති කිසිම පාලන ක්‍රමයකින් මගේ රාජකාරියට බලපෑමක් වෙලා නෑ . අනික මම සංස්ථාව තුල ක්‍රියාත්මක වන කිසිම වුර්තීය සමිතියක සාමාජිකත්වය මේ වන තෙක් ලබා ගෙන නෑ . මාධ්‍ය වේදියෙකු රටට කථා කරනවා මිසක පක්ෂයකට කතා කරන සිරිතක් නෑ .

ගීතය කියන්නේ මගේ ආත්ම ප්‍රකාෂණයයි ,මට පුලූවන්නම් තව කෙනෙකුව මගේ ගීතය තුල ජීවත් කරවන්න කෙනෙකුට වෙනස් විදිහට හිතන්න සලස්වන්න ,කෙනෙකුගේ පරිකල්පණය දියුණු කරන්න බුද්ධිය මණස අවදි කරන්න , වින්දනාත්මක පිරිසක් බිහිකරන්න ගේය පද රචකයෙකු ලෙස මම බලාපොරොත්තු වෙන්නේ එයයි.සංගීතයට පුලූවන්නම් සතුට සහ ,පිරුණු බව කෙනෙකුගේ ජීවිතයට දෙන්න .සුභාවිත ගීතය කියන්නේ අන්න ඒකටයි .ලසු භාවිතය ල කියන්නේ නිවැරදි භාවිතය කියන අරුතයි .ගෙය පද රචකයකු ලෙස මගේ වෑයම මේ සුභාවිත ගීතය පෝෂණය කරලීමයි .මම පද රචනා දුන් අය අතර වික්ටර් රත්නායක ,අමරසිරි පීරිස් ජගත් වික්ක්‍රමසිංහ ,ඉන්ද්‍රානි බෝගොඩ ,වැනි ය සදහන් කරන්න පුළුවන් .ජගත් වික්‍රමසිංහ ගයන ලඉසුරු කොදෙව්වේ පාලූ ඉසව්වේ ල වැනි ගීත අද පරම්පරාව අතරත් ඉතාම ජනප්‍රියයි .

අද මේ තියෙන රූප රචනා රැල්ලට නම් මම හරිම විරුද්දයි.ගීතයක් ඇසෙන විට ශ්‍රාවකයා තුල ඇකෙෂන චිත්ත රූපය තමයි නියම රූප රචනය .එය පුද්ගලයාගෙන් පුද්ගලයට වෙනස් වෙනවා .අපි කවුරු හරි ගීතයට අපිට හිතෙන විදිහට චිත්ත රූපයක් මවනවානම් අපි කරන්නේ ශ්‍රාවකයාගේ සිතීමේ ශක්තිය මොට කිරීමක්මක් විතරයි .අනික ඇයි අපි ශ්‍රාවකයා ,ප්‍රේක්ෂකයෙක් කරන්න වෑයම් කරන්නේ .ඉඩ දෙන්න ඔහුට හෝ ඇයට සිතන්න .ඉඩ දෙන්න පරිකල්පණය කරන්න .

තාක්ෂණය මට මෙවලමක් මිස ආභරණයක් නොවෙයි .මම තාක්ෂණයප්‍රතික්ෂේප කරනවත් නොවෙයි .නමුත් මම තාක්ෂණය සමග බොහෝවිට